**හරිත බලශක්ති සංවර්ධන සහ බලශක්ති කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහනේ (අදියර II)- 2022**

-----------------------------------------------------------------------------------------------------------------------

හරිත බලශක්ති සංවර්ධන සහ බලශක්ති කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහනේ (අදියර II) 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ආසියානු සංවර්ධන බැංකුව (ADB) අතර 2016 දෙසැම්බර් 27 දින එළඹි අංක 3483- එස්ආර්අයි සහ 3484- එස්ආර්අයි දරන ණය ගිවිසුමේ IV වාවස්ථාවේ 4.04 වගන්තිය සහ ප්‍රංශ නියෝජිත ආයතනය අතර 2018 ඔක්තෝම්බර් 17 දින එළඹි අංක සීඑල්කේ 1022 01කේ දරණ ණය පහසුකම් ගිවිසුමේ 03 වාවස්ථාවේ 3.4.4 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළයුතු යැයි මා සලකන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා කාලය

වැඩසටහනේ ණය ගිවිසුම අනුව, විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ හා ලංකා විදුලිබල මණ්ඩලය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. පිවිතුරු විදුලිබල උත්පාදනය, පද්ධති කාර්යක්ෂමතාව සහ විශ්වසනීය බව වැඩිදියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. සම්ප්‍රේෂණ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම, මධ්‍යම වෝල්ටීයතා ජාල කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම සහ විදුලිබල කාර්යක්ෂමතාවය සඳහා ඉල්ලුම් කළමනාකරණය යනාදි සංරචක 3ක් යටතේ ව්‍යාපෘතියේ කටයුතු ක්‍රියාත්මක වේ. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 39,808.25 කට සමාන වූ එජඩො මිලියන 260 වන අතර ඉන් රු. මිලියන 27,985.45 කට සමාන වූ එජඩො මිලියන 180 ක් සැපයීම සඳහා ආසියානු සංවර්ධන බැංකුව සහ ප්‍රංශ නියෝජිත ආයතනය සමඟ එකඟ වී තිබුණි. ඉතිරි මුදල රු.මිලියන 11,822.80 කට සමාන වූ එජඩො 80 ක් ලංකා විදුලිබල මණ්ඩලය විසින් මූල්‍යනය කිරීමට බලාපොරොත්තු වේ. ව්‍යාපෘතියේ කටයුතු 2017 ජූලි 10 දින ආරම්භ කරන ලද අතර, 2021 දෙසැම්බර් 31 දින වනවිට නිම කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේවෙතත්, ව්‍යාපෘතිය අවසන් කරන දිනය 2024 ජනවාරි 10 දක්වා දීර්ඝ කර තිබුණි.

## 1.3 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2 වගුවෙන් විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, ව්‍යාපෘතියේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වැඩසටහනේ වියදම් ප්‍රකාශනය හා එහි මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2 වගුවේ විස්තර කර ඇති කරුණු සම්බන්ධයෙන් මාගේ මතය තත්ත්වාගණනය කරනු ලබයි. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විසින් විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය පරීක්ෂා කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

### 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුනු පිලිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| ගිණුම්කරණ අඩුපාඩුව | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| 2022 දෙසැම්බර් 31 දිනට ආසියානු සංවර්ධන බැංකුවේ සහ ප්‍රංශ නියෝජිත ආයතනයේ ණය ශේෂය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත -21 අනුව වාර්තා කළ දිනයේ ශ්‍රී ලංකා රුපියල් අගයට පරිවර්තනය කර නොතිබූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දැක්වෙන ණය ශේෂය සහ සංවර්ධන වියදම් ශේෂය අඩුවෙන් දක්වා තිබුණි | අතිරේක සාමාන්‍යාධිකාරී (ව්‍යාපෘති) යටතේ ශාඛා ගිණුම් කට්ටලයක් ලෙස ව්‍යාපෘති ගිණුම් ක්‍රමවත්ව දැක්වීම ලංකා විදුලිබල මණ්ඩලයේ භාවිතය වේ. මෙය ඉතිහාසය පුරාවටම විගණකවරුන් සහ ආසියානු සංවර්ධන බැංකුව විසින් නිසි ලෙස පිළිගෙන ඇති අතර මෙතෙක් කිසිදු විමසීමක් සිදුකර නොමැත. අතිරේක සාමාන්‍යාධිකාරී (ව්‍යාපෘති) යටතේ සියලුම ව්‍යාපෘති ක්‍රියාත්මක කරනු ලබන්නේ ලංකා විදුලිබල මණ්ඩලයේ ප්‍රතිපත්ති සහ සාමාන්‍යයෙන් | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සකස් කළ යුතුය. |

පිළිගත් මූලධර්මවලට අනුකූලව ණය විසර්ජනය සහ අදාළ වත්කම් ඉදිකිරීම වාර්තා කරන අතරතුරය. ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව ඓතිහාසික පිරිවැය සම්මුතිය යටතේ සියලුම ගනුදෙනු පොදු ලෙජරයේ සටහන් කර ඇත. අදාළ ණය මුදල් අමාත්‍යාංශයේ මඟපෙන්වීමට අනුකූලව ලංකා විදුලිබල මණ්ඩලයේ මූල්‍ය කළමනාකරු විසින් නඩත්තු කිරීම සහ පරිපාලනය කිරීම සහ පියවීම සිදු කරයි. එබැවින්, ලංකා විදුලිබල මණ්ඩල මූලස්ථානයේ පොදු ලෙජරය යටතේ ණය සටහන් කර ඇත.

## 3. භෞතික කාර්යසාධනය

### 3.1 ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳ භෞතික හා මූල්‍ය ප්‍රගතිය

ණය ගිවිසුමට අනුව, වැඩසටහනේ ආරම්භක කටයුතු සම්ප්‍රේෂණ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම, මධ්‍ය වෝල්ටීයතා ජාලයේ කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම සහ විදුලිබල කාර්යක්ෂමතාව සඳහා ඉල්ලුම් කළමනාකරණය වැඩිදියුණු කිරීම යන ප්‍රධාන සංරචක 03 ක් යටතේ සැලසුම් කර ක්‍රියාත්මක කිරීමට නියමිත තිබූ අතර පැකේජ හයක් යටතේ කොන්ත්‍රාත්තු ප්‍රදානය කිරීමට අපේක්ෂිත විය.

| අංකය | සංරචකය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පැකේජය 2 ලොට් බී 2හි පාදුක්ක - හොරණ කිලෝ වොට් 132, කිලෝ මීටර 25 සම්ප්‍රේෂණ මාර්ගයේ සහ හබරණ වාලච්චේන කිලෝ වොට් 132 සම්ප්‍රේෂණ මාර්ගයේ 2 වන පරිපථයේ ඉදිකිරීම් 2020 අප්‍රේල් 30 වන දින ආරම්භ කරන ලද අතර එය 2023 ජුනි 14 වන දින නිම කිරීමට බලාපොරොත්තු විය . ලද තොරතුරු අනුව සියයට 41.3ක් සහ සියයට 42.5ක අඩු භෞතික හා මූල්‍ය ප්‍රගතියක් පෙන්නුම් කර තිබුණි. | රටේ පවතින ආර්ථික අර්බුදකාරී තත්ත්වය හේතුවෙන් මිල ඉහළ යාම නිසා ඉදිකිරීම් සහ ඉදිකිරීම් කටයුතු සඳහා තමාට පැමිණීමට නොහැකි වීම පිළිබඳව කොන්ත්‍රාත්කරු කිහිප වතාවක්ම දැනුම් දී ඇත. මේ බව ලංකා විදුලිබල මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලයට සහ ADB වෙත දන්වා ඇත. ඉතිරි ද්‍රව්‍ය ප්‍රසම්පාදනයේ ප්‍රගතිය අධීක්ෂණය කරන ලෙසත්, එය සෑහීමකට පත්වන්නේ නම් කොන්ත්‍රාත්තුව හරහා සිදු කළ යුතු සිවිල් ඉදිකිරීම් සහ ද්‍රව්‍ය මිලදී ගැනීම් විෂය පථයෙන් ඉවත් කරන ලෙසත් ලංකා විදුලිබල මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය දැනුම් දී ඇත. ඉදිකිරීම් කටයුතු ලංකා විදුලිබල මණ්ඩලය මගින් සිදුකෙරේ. AFD, අරමුදල් ඒජන්සිය ඒ සඳහා කැමැත්ත ලබා දී ඇත. | වැඩ කඩිනම් කිරීමට කටයුතු කළ යුතු අතර කොන්ත්‍රාත්කරුවන්ගේ වැඩ සමීපව නිරීක්ෂණය කළ යුතුය. |
| (ආ) | පැකේජය 5 ප්‍රාථමික උපපොළවල් ඉදිකිරීම වැඩිදියුණු කිරීම 2020 සැප්තැම්බර් 21 වන දින ආරම්භ කරන ලද අතර 2023 මැයි 31 වන දින අවසන් කිරීමට අපේක්ෂා කරන ලදී. ලද තොරතුරු අනුව 2022 දෙසැම්බර් 31 වන විට සියයට 55 ක් සහ සියයට 73 ක් | 2023 මැයි 31 වන දිනට සමස්ත භෞතික ප්‍රගතිය සියයට 63ක් වූ අතර මූල්‍ය ප්‍රගතිය සියයට 73ක් විය. රත්තනපිටිය PSS ඉඩම කොන්ත්‍රාත්කරුට ලබා නොදීම අපේක්ෂිත ප්‍රගතිය ලබා නොගැනීමට ප්‍රධාන හේතුව විය. රත්තනපිටිය ඉඩම සම්බන්ධයෙන් වසර 3කට වැඩි කාලයක සිට ඉඩම් හිමියාගේ විරෝධතා ප්‍රශ්නයක් ඇදී ගිය අතර මේ වන විට එය | වැඩ කඩිනම් කිරීමට කටයුතු කළ යුතු අතර කොන්ත්‍රාත්කරුවන්ගේ වැඩ සමීපව නිරීක්ෂණය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | තරම් අඩු භෞතික හා මූල්‍ය ප්‍රගතියක් පෙන්නුම් කර තිබුණි. | සම්පූර්ණයෙන්ම සමථයකට පත් වී ඇත. රත්තනපිටිය ඇතුළු PSS භූමි භාග තුනේම ඉතිරි වැඩ අවසන් කිරීම සඳහා සාධාරණ කාලය දීර්ඝ කිරීමක් (2023 නොවැම්බර් 15 දක්වා) කොන්ත්‍රාත්කරුට ලබා දෙන ලදී. | |
| (ඇ) | පැකේජය 9: කිලෝ වොට් 220 කෙරවලපිටියේ ස්විචින් ස්ටේෂන් ඉදිකිරීම 2020 අගෝස්තු 14 වන දින ආරම්භ කරන ලද අතර 2023 සැප්තැම්බර් 30 වන දින අවසන් කිරීමට අපේක්ෂා විය. ලද තොරතුරුවලට අනුව 2022 දෙසැම්බර් 31 දිනට සියයට 45ක් සහ සියයට 25.3ක් තරම් අඩු භෞතික හා මූල්‍ය ප්‍රගතිය එහි පෙන්වා දී තිබුණි. | පැකේජය 9: කිලෝ වොට් 220 කෙරවලපිටිය ස්විචින් ස්ටේෂන් හි මූල්‍ය ප්‍රගතිය සියයට 69 ක් වන අතර භෞතික ප්‍රගතිය සියයට 65 කි. ව්‍යාපෘතිය 2023 සැප්තැම්බර් 30 වන විට අවසන් කිරීමට බලාපොරොත්තු වේ. | වැඩ කඩිනම් කිරීමට කටයුතු කළ යුතු අතර කොන්ත්‍රාත්කරුවන්ගේ වැඩ සමීපව නිරීක්ෂණය කළ යුතුය. |
| (ඇ) | ව්‍යාපෘති පරිපාලන අත්පොතට අනුව ස්මාර්ට් ග්‍රිඩ් සහ මිනුම් නියමු උප ව්‍යාපෘතිය සඳහා ඩොලර් මිලියන 11.1ක් වෙන් කර ඇත. කෙසේ වෙතත් නියමු ව්‍යාපෘතිය 2023 ජුනි මාසය වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි.. | කටුනායක ස්මාර්ට් මිනුම් ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය එජඩො මිලියන 2 දක්වා සංශෝධනය කරන ලදී. මෙය ආසියානු සංවර්ධන බැංකුවට දන්වා ආසියානු සංවර්ධන බැංකුවේ අනුමැතිය ලබාගෙන ඇත.ටෙන්ඩරය ප්‍රදානය කිරීම සඳහා DPC අනුමැතිය 2022 නොවැම්බර් 1 වන දින ලබා දෙන ලදී. ලංසුව සහ ලංසු සුරක්ෂණය කල් ඉකුත් වී ඇති බැවින් ලංසු වලංගුභාවය සහ ලංසු සුරක්ෂණය මෙම දිනට පෙර දීර්ඝ කරන ලෙස ලංසුකරුගෙන් දැනටමත් ඉල්ලා තිබුණි. රටේ පවතින ආර්ථික තත්ත්වය හේතුවෙන් ලංසුකරු විසින් ලංසු මිල ඉහළ නැංවීමක් ඉල්ලා සිටි අතර ලංසුව සහ ලංසු සුරක්ෂණයේ වලංගුභාවය දීර්ඝ නොකර ගිවිසුමේ ගෙවීම් සහ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් පැහැදිලි කිරීම් කිහිපයක් ඉල්ලා සිටියේය. ලංසුකරුගෙන් මෙතෙක් ධනාත්මක ප්‍රතිචාරයක් ලැබී නොමැත. | කොන්ත්‍රාත් පරිපාලන කටයුතු කාර්යක්ෂමව සිදු කළ යුතුය. |

**3.2 පද්ධති හා පාලනයන්**

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| ව්‍යාපෘතියට පවරන ලද දේපල, පිරියත සහ උපකරණ වාර්තා කිරීම සඳහා විධිමත් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන යාමට ව්‍යාපෘතිය කටයුතු කර නොතිබුණි. . | ව්‍යාපෘති අනුව සම්පූර්ණ ව්‍යාපෘති අංශය සඳහා ස්ථාවර වත්කම් ලේඛනයක් මූල්‍ය ශාඛාවේ නිසි ලෙස පවත්වාගෙන යනු ලබන අතර විගණනයේදී ඔබ වෙත ඉදිරිපත් කරන ලදි. | ව්‍යාපෘතිය ආරම්භයේ සිටම ස්ථාවර වත්කම් ලේඛනය අඛණ්ඩව පවත්වාගෙන යා යුතුය. |